## 2019/10/08 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2019/10/08 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. එඬේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 27. පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

### 01. ආගම සිහි කිරීම

2019.10.08 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. උප සභාපතිතුමා ඇතුළු පැමිණ සිටින සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඉතා ගෞරවයෙන් පිළිගනිමින්, 2019 ඔක්තෝම්බර් මාසයට අදාල සැසි වාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. පෙර සභාවල පරිදිම ඔබ සියළු දෙනාගේ සහයෝගය මම ඉතා ගෞරවයෙන් අපේක්ෂා කරනවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

i. ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ඔහුගේ වෙනත් කරුණු දැක්වීමේදී සහා බල ප්‍රදේශය තුල කටුපොල් වගාව 80% ක් හෝ ඊට වැඩි හෙක්ටයාර් ප්‍රමාණයක් වගා කර ඇති බව සඳහන් කලද, පසුගිය වාර්තාවේ සටහන් වී ඇත්තේ 8% ක් බවද, එය 80% ක් ලෙස නිවැරදි විය යුතු බවද, ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් පෙන්වා දෙන ලදී.

**(අ)02. 2019.09.10 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

2019.09.10 දින පැවති මහා සභාවේ සභා වාර්තාව ඉහත සංශෝධනයන්ට යටත්ව, සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස **ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

i. ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන ( පුනරාවර්තන) – 2019 මැයෙන් අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් යොමු කරන ලද 2019.09.30 දිනැති ලිපිය සභා ගත කරන ලදී.
අදාළ මාර්ග සංවර්ධනය කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් අනුමැතිය ලැබී ඇති මුත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා තවම අනුමැතිය ලැබී නොමැති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ii. මාපිය මෙහෙවර සඳහා ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරය ලබා ගැනීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, උඩුගම විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.
මෙම ලිපියෙහි ශ්‍රවනාගාරය නොමිලේ ලබා දෙන ලෙස සඳහන් කර නැතත්, වාචිකව මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන ලෙස කියා සිටි බවත්, වයෝවෘද්ධ දෙමාපියන් කැඳවා කරන වැඩසටහනක් බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.
මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා සහ ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා කියා සිටියේ මේ සඳහා සම්බන්ධ වන පිරිස් කවුද? සම්බන්ධ කර

ගන්නේ කෙසේද? යන්න සොයා බලා ශ්‍රවනාගාරය ලබාදීමට කටයුතු කරන ලෙසයි.නැතිනම් පසුව ඔබතුමාට අපහසුතාවයට පත්වීමට සිදුවේවි යනුවෙනි.

iii. මලාමුර වී මෝල අසළින් පොල්ගහකන්ද දක්වා දිවෙන මාර්ගය සභාවට පවරා ගැනීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රිනී චන්දිමා දිල්රුක්ෂි මහත්මිය විසින් යොමු කරන ලද 2019.09.29 දිනැති ලිපිය සභාගත කරන ලදී.
මේ සම්බන්ධව ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, පසුගිය දිනවල පාරවල් ඇතුළු සභාවට පවරා ගත යුතු සියළු දේ ලිඛිතව සභාවට ලබා දෙන ලෙස සියළු දෙනා දැනුවත් කල බවත්, නිතර නිතර එකින් එක නොඑවන ලෙසත්, පවරා ගත යුතු පාරවල් එකවර ගැසට් කිරීම සඳහා ලබා දෙන ලෙසත්, සියළුම මන්ත්‍රීවරු තමන්ගේ බල ප්‍රදේශයේ තිබෙන පවරා ගත යුතු පාරවල් දුර ප්‍රමාණයන් සහිතව ලබන දෙසැම්බර් මස වන විට වත් ලබාදීමට කටයුතු කරන ලෙසත්, එසේ නියමිත ආකාරයට ලබා දුන් විට ඉදිරි කටයුතු පහසු වන බවත් , පවරාගැනීමේ කටයුතු පහසු කාර්යයක් නොවන බවත් ප්‍රකාශ කළේය.

iv. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන 2019 සම්බන්ධව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් යොමු කරන ලද 2019.09.19 දිනැති ලිපිය සභාගත කරන ලදී.
මේ සඳහා අනුමැතිය ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

v. උඩුගම උප කාර්යාල ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම සම්බන්ධව ප්‍රජා සංවර්ධන නිලධාරී, කේ.ජී.ජයනි මහත්මිය විසින් යොමු කරන ලද 2019.10.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.
මෙහිදී, උක්ඕවිට පෙර පාසල සංවර්ධනය කිරීම සඳහා රු. ලක්ෂ 3 ක ප්‍රතිපාදන වෙන්වී ඇති බවත්, ඒ සඳහා ඇස්තමේන්තු සකස් කර කටයුතු කිරීමට සූදානම් වීමේදී, පෙර පාසල් භූමිය පහත් බිම් කඩක පිහිටා ඇති බැවින් වැසි කාලයේදී එහි වැසිකිළිය උතුරා යාමට ලක්වීමේ ගැටළුව පැන නැගුන බවත්, එය වලක්වා ගත නොහැකි බැවින්, අදාළ ලක්ෂ 03 ක මුදල යොදවා උපකාර්යාලයේ වහල ප්‍රතිසංස්කරණය කර, පෙරපාසල එම ස්ථානයට රැගෙන යාමට යෝජනා වී ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

vi. උසස් පෙළ දේශපාලන විද්‍යාව නව විෂය නිර්දේශයට අයත් පොත්වල පිටපත් පුස්තකාලයට ලබා දීම සම්බන්ධව පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්ය ජී.ඩී.ආර්.යූ.යූ. අබේරත්න මහතා විසින් යොමු කරන ලද 2019.09.11 දිනැති ලිපිය සභාගත කරන ලදී.
දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්ය ජී.ඩී.ආර්.යූ.යූ. අබේරත්න මහතා විසින් රචිත උසස් පෙළ දේශපාලන විද්‍යාව නව විෂය නිර්දේශයට අයත් පොත්වල පිටපත් 02 බැගින් නාගොඩ ප්‍රාදේශීය සභා පුස්තකාල සඳහා මිළදී ගැනීමට තීරණය විය.

vii. දිරිය ගෙවිලිය ගෙවතු වගා තරඟාවලිය 2019 යන මැයෙන් ගරු මන්ත්‍රිනී බී.ජී. අරුණ ශාන්ති මහත්මිය විසින් ගරු සභාපතිතුමා ඇතුළු සියළු මන්ත්‍රීවරුන්ට ප්‍රණාමය පුද කර යොමු කරන ලද 2019.10.07 දිනැති ලිපිය සභාගත කරන ලදී.

viii. තල්ගස්වල සති පොළෙහි බදු වාරිකය සම්බන්ධව කේ.බී. වසන්ත මහතා විසින් යොමු කරන ලද 2019.10.04 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින්, ගරු සභාපතිතුමා ප්‍රකාශ කළේ, මේ පිළිබඳව තමා සමඟ කතා කල බවත්, එවිට එම කාරණය ලිපියකින් ඉදිරිපත් කරන ලෙසත්, එවිට මහා සභාවට ඉදිරිපත් කල හැකි බවත්, ඔහුට පැහැදිලි කල බවයි. ඊට අමතරව, මේ ඉල්ලීම ඉටු කල නොහැකි බවත්, නමුත් අනාගතයේදී මෙසේ ලිඛිතව ඉදිරිපත් කිරීම තුලින් ඔහුට යම් ප්‍රයෝජනයක් විය හැකි බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලද බවයි. මේ සම්බන්ධව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය, ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතාද අදහස් දක්වන ලදී.

ix. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ ප්‍රාග්ධන වැඩසටහන - 2019 මැයෙන් අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් යොමු කරන ලද 2019.09.19 දිනැති ලිපිය සභා ගත කරන ලදී.

x. යටලමත්ත 70 කන්ද පන්සල් භූමියට මායිම්ව පිහිටි පාර සම්බන්ධව බී.නාගොඩවිතාන මහතා විසින් යොමු කරන ලද 2019.10.07 දිනැති ලිපිය සභාගත කරන ලදී.

xi. සේවයෙන් ඉවත්වීම සම්බන්ධව ජී.කේ.අරුනෝලිස් මහතා විසින් යොමු කරන ලද 2019.09.30 දිනැති ලිපිය සභාගත කරන ලදී.
ජී.කේ.අරුනෝලිස් මහතා විසින් මෙතෙක් කරන ලද සේවය අගය කරන බවත්, ඔහු විසින් කරන ලද කටයුතු ඉදිරියට සිදු කිරීම සඳහා ඔහුගේ මුණුපුරා පත් කර ගන්නා ලෙස කර ඇති ඉල්ලීම පිළිබඳව සළකා බලන බවත්, ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කළේය.

xii. ප්‍රාදේශීය සභාව සතු මාර්ගයේ නල එළීම සඳහා අවසර ලබා ගැනීම යන මැයෙන් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් කාර්යාලය මගින් යොමු කරන ලද 2019.09.12 දිනැති ලිපිය සභාගත කරන ලදී.
ජල නල එළීම සඳහා මාර්ගය අයිනෙන් කාණු යොද බවත්, පාර හරහා යන ස්ථානවල බෝක්කු යටින් නල ගෙන යන බවත්, පාරවල් පළුදු නොකරන බවත්, ජල සැපයුම් දෙපාර්තමේන්තුව මගින් මා හට දැන්වූ බවත්, නමුත් මාර්ග උරහිසෙහි යොදන කාණු නැවත තිබූ අයුරින්ම සකස් කළ යුතු බව ඔවුනට දැන්වූ බවත්, අදාළ කටයුතු තාක්ෂණ නිලධාරී අධීක්ෂණය යටතේ සිදු කිරීමට අවසර ලබා දෙන බවත්, ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. ගරු උප සභාපතිතුමාද ප්‍රකාශ කර සිටියේ, කාර්මික නිලධාරීගේ අධීක්ෂණය යටතේ අදාළ කටයුතු සිදු විය යුතු බවයි.

xiii. ජල නල එළීම සම්බන්ධව ගිංසොබා ප්‍රජා මූල සංවිධානය විසින් යොමු කරන ලද 2019.08.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්න**

**i.** මීට මාස 11 කට පෙර, ජල ගැලීම හේතුවෙන් ආපදාවට ලක්වන ජනතාවගේ ආරක්ෂාව සඳහා භාවිතා කිරීමට බෝට්ටුවක් හා ආරක්ෂිත කබා සභාවට ලබා ගැනීමට යෝජනා කල අතර, එම උපකරණ ලබා ගත්තාද? නැතිද?

**අදාල අමාත්‍යාංශවලට දැණුම් දී ඇති නමුත් තවම ලැබී නොමැති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.**

ii. මීට පෙර සභාව සතුව තිබූ පුස්තකාල ජංගම රථය තිබෙනවාද? එය නැවත ධාවනය කල හැකිද?
**පුස්තකාල රථය තිබෙන නමුත් එය ධාවනය කල හැකි මට්ටමේ නොමැති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.**

iii. සභාව සතු ලේඛනවල තොරතුරු පරිගණක ගත කර තිබේද?
**මේ වන විට පරිගණක ගත කරමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.**

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

i. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මගින් ඉල්ලා ඇති පරිදි නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කැප්පිටියගොඩ උතුර, දකුණ සහ නාගොඩ යන ගම්මාන සඳහා ප්‍රජා ජල අභිමානී වැඩසටහන යටතේ ප්‍රාදේශීය සභාව සතු මාර්ගවල ගාස්තු අය කිරීමකින් තොරව ජල නල එළීම සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

ii. 2020 වර්ෂයට ආදායම් රැස් කිරීමට අදාළව පහත සඳහන් පරිදි කටයුතු කිරීමට යෝජනා කරමි.

**නාගොඩ ප්‍රාදේශීය සභාව**

**2020 වර්ෂයට ආදායම් රැස් කිරීමට අදාළ යෝජනාව**

**2020 වර්ෂයට බලපත්‍ර ලබාදීමේදී ගාස්තු පැනවීම**

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය යටතේ නාගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උප ලේඛනයේ I වන තීරයේ නිරූපිත යම් කාර්යක් සඳහා නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2020 වර්ෂයේදී නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අය කල යුතු බවටත් යෝජනා කරමි.
1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනත යටතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ එම මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගන්නා හෝටලයක්,ආපන ශාලාවක් හෝ නවාතැන්පලක් ඉහත කී උපලේඛනයේ II වන අවස්ථාවක තීරුවේ කුමක් සඳහන් වුවද එකී හෝටලය, නවාතැන්පල, ආපනශාලාව පවත්වාගෙන යනු ලබන ස්ථානය වෙනුවෙන් එකී හෝටලයේ, ආපන ශාලාවේ, නවාතැන්පලේ 2019 වර්ෂයට ලැබූ ආදායමෙන් 1% බලපත්‍ර ගාස්තුවක් විය යුතු බවත් ගරු සභාවට යෝජනා කරමි.

## උපලේඛනය

**1 තීරුව** **11 තීරුව**

| අනු අංකය | බලය දෙනු ලබන කාර්යය | පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු. 750 නොඉක්මවන අවස්ථාවක | රු. 750 ඉක්මවන එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක | රු.1500 ඉක්මවන අවස්ථාවක |
| 1 | භෝජනාගාරයක් හෝ හෝටලයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 2 | තේ හෝ කෝපි කඩයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 3 | බත් කඩයක් (කෑමට හෝ පාර්සල්) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 4 | ආපන ශාලාවක් පවත්වා ගෙන යාම (සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි නොවූ) | 500.00 | 750.00 | 1,000.00 |
| 5 | ලැගුම්හලක් පවත්වා ගෙන යාම (සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි නොවූ) | 500.00 | 750.00 | 1,000.00 |
| 6 | බේකරියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 7 | මස් විකුණන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 8 | මාළු විකුණන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 9 | ශීතකරණවල තබා මස් හෝ මාළු ගබඩා කිරීම විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 10 | පිසින ලද ආහාර සකස් කර සපයන ස්ථානයක් පවත්වා ගෙන යාම (කේටරින් සර්විස්) | 500.00 | 750.00 | 1,000.00 |
| 11 | නරක් විය හැකි ආහාර ද්‍රව්‍යය හා කුලු බඩු තොග හා සිල්ලරට විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 12 | කොණ්ඩා කැපීම, මසාජ් කිරීම සඳහා බාබර් සාප්පුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 13 | රස කැවිලි නිපදවීම, කේක් වර්ග නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

## අප්‍රසන්න වෙළඳාම්

| | | | | |
|---|---|---|---|---|
| 01 | ඝෝගාතකාගාරයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 02 | කුකුළන් 1000ට අඩු කුකුල් කොටුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000,00 |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| 03 | කුකුළන් 1000ට වැඩි කුකුල් කොටුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 04 | ඌරන් 25ට අඩු ඌරු කොටුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 05 | ඌරන් 25ට වැඩි ඌරු කොටුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 06 | එළදෙනුන් 25ට අඩු ඇති කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 07 | එළදෙනුන් 25ට වැඩි ඇති කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 08 | කූල්ස්පොට් එකක් හෝ කිරිහලක් හෝ ස්නැක් බාර් එකක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 09 | පපඩම් හෝ නූඩ්ලස් නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 10 | අයිස් ක්‍රීම් , යෝගට්, බිම පැකට් නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |
| 11 | ජෑම්, සිරප්, සෝස් වර්ග, නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 12 | කරවල, ජාඩි, වේලීම හෝ විකිණීම, ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 13 | කුරුඳු තැලීම, කුරුඳු තෙල් මඩුවක් පවත්වා ගෙන යාම හෝ කුරුඳු දර විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 14 | ඔසු පැන්හලක් , කොළ කැඳ හෝ බැදපු කඩල, රටකජු (ටේස්ට් කඩල) විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 15 | පානීය ජලය බෝතල් කර ගබඩාකර තැබීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 16 | පොල්තෙල් මෝලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 17 | මෙඩි ලැබ් එකක් (ලේ හා මුත්‍රා පරීක්ෂා කිරීමේ) ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 18 | පශු වෛද්‍ය ගිලන් හලක් හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 19 | ත්‍රීරෝද රථ මෝටර් සයිකල් සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 20 | අවමංගල සේවා සපයන ස්ථානයක් (මල් ශාලාවක් ) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

## අන්තරාදායක ව්‍යාපාර

| | | | | |
|---|---|---|---|---|
| 01 | කොන්ක්‍රීට් සිලින්ඩර් හෝ වෙනත් සිමෙන්ති භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |
| 02 | සිමෙන්ති බ්ලොක් ගල්, මල් පෝච්චි, බීරලු නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | පොහොර වර්ග, කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම,සත්ව ආහාර වර්ග නිපදවීම, ගබඩා කර තැබීම හෝ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1,000.00 |
| 04 | ලියවන පට්ටලයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | වෙල්ඩින් වැඩ පළක් හෝ ඩ්‍රිල් වැඩ පළක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 06 | ලි මෝලක් හෝ දැව ගබඩාවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 07 | යන්ත්‍රානුසාරයෙන් කලුගල් ඇඹරීම, ගල් පිපිරවීමේ ගල් මෝලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 08 | යාන්ත්‍රික වඩු මඩුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 09 | වැලි ගොඩ දැමීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 10 | වී පාහින මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 11 | ස්ක්‍රීන් ප්‍රින්ටින් වැඩ පළක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 12 | බැටරි චාර්ජ් කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 13 | ෆයිබර් ග්ලාස් වැඩ පලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 14 | යකඩ කම්හලක් පවත්වා ගෙන යාම (යන්ත්‍ර ඇති/නැති) | 500.00 | 750.00 | 1000.00 |
| 15 | මුද්‍රණාලයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## නාගොඩ ප්‍රාදේශීය සභාව
## 2020 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

### යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තිය (1) වන උප වගන්තියේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත කරගෙන යනු ලබන පහත සඳහන් උපලේඛනයෙහි I වන තීරුවෙහි සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උප ලේඛනයෙහි II වන තීරුවෙහි එක් එක් කර්මාන්තය පවත්වා ගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කල යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තකු 2020 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර නාගොඩ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට ගරු සභාවට යෝජනා කරමි.

### වෙළඳාම් කර්මාන්තයේ ස්වභාවය

| | | | | |
|---|---|---|---|---|
| 1. | පොල් එකතු කරීමේ හෝ තොග හෝ සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 2. | සහල් තොග හෝ සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 3. | ලී වෙළඳ සැලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 4. | පොල් පරාල හා යට ලී විකුණන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 5. | දර මඩුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 6. | ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 7. | සාමාන්‍ය වඩු මඩුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 8. | මැටි බඳුන් නිපදවීම ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |
| 9. | සාප්පු බඩු මනි බඩු සුවඳ විලවුන් ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 10. | ත්‍රිරෝද රථ මෝටර් සයිකල් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 11. | පාවහන් අලෙවිකරණ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12. | ඇඳුම් පිරිසිදු කිරීමේ ස්ථානයක් (ලොන්ඩ්‍රියක්) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000,00 |
| 13. | සිල්ලර කඩයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 14. | එළවළු හෝ පළතුරු විකුණන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 15. | පාපැදි අලුත්වැඩියා කිරීමේ (වින්කලයක්) ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 750.00 |
| 16. | මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් (ගරාජයක්) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 17. | පාපැදි විදුලි භාණ්ඩ ශිතකරණ හෝ මහන මැෂින් හා අමතර කොටස් විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 18. | විසිතුරු භාණ්ඩ හෝ කැටයම් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 19. | විසිතුරු භාණ්ඩ හෝ කැටයම් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 20. | සම් භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |
| 21. | බුලත්, පුවක්, කොහු, ඉදල්, කෙසෙල් කැන්, පලා වර්ග, මැටි භාණ්ඩ, තැඹිලි විකිණීම (සාමාන්‍ය වෙළඳාම) | 500.00 | 750.00 | 1000.00 |
| 22. | සිංහල බෙහෙත් ශාලාවක් පවත්වා ගෙන යාම හෝ සිංහල බෙහෙත් බඩු විකුණන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 23. | දන්ත චිකිත්සාගාරයක් දත් බඳින ස්ථානයක් එක්ස්රේ යන්ත්‍රයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 24. | | 500.00 | 750.00 | 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | විකිණීම සඳහා බිම්මල් හෝ වෙනත් මල් පැල වර්ග තවාන් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම | | | |
| 25. | ප්ලාස්ටික් භාණ්ඩ විකුණිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 26. | ජ්‍යොතිෂ්‍ය කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 27. | මනාලියන් හැඩ ගැන්වීම (බියුටි සැලුන්) උපකරණ කුලියට දිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 28. | රෙදි පිලි විකිණිමේ ස්ථානයක් (රෙදි කඩයක්) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 29. | ඇදුම් මැසිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 30. | ඇස් කණ්නාඩි නිපදවිම, විකිණිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 31. | ඡායාරූප ශාලාවක් (ස්ටුඩියෝවක්) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 32. | පින්තුර රාමු කරන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 33. | සි.ඩි,වි.සි.ඩි, විඩියෝ කැසට් ගීත පටිගත කිරීම හෝ විකිණිම පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 34. | ලිපි ද්‍රව්‍ය, පුවත්පත්, සගරා, පාසැල් උපකරණ (බුක්ෂොප්) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 35. | දෙස් විදෙස් දුරකථන ඇමතුම් ලබාදිමේ ස්ථානයක් (කමියුනිකේෂන්) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 36. | ක්ෂණික ඡායා පිටපත් කිරීම, රෝනියෝ කිරීම, ලැමිනේටින් කිරීම, යතුරු ලියනය කරදිම ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 37. | පරිගණක යන්ත්‍ර විකිණිමේ අලුත්වැඩියා කිරීම, පුහුණු පාඨමාලා පැවැත්විම ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 38. | විදේශ චෙක්පත් (මුදල්) මාරු කරන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 39. | කුෂන් වැඩ පලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 40. | අට පිරිකර පුජා භාණ්ඩ ගබඩා කිරීම හා විකිණිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 41. | සංගිත භාණ්ඩ කුලියට දිම හා නිපදවිම හෝ විකිණිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000,00 |
| 42. | කිරුම් මිනුම් උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 43. | මදුරු දැල් මහන ස්ථානයක් හෝ විකුණන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 44. | පුවත්පත් දැන්වීම් පළ කිරීමේ ඒජන්සියක් හෝ පුවත්පත් විකිණීම සඳහා ඒජන්සියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 45. | බෝට්ටු ඔරු සේවාවන් පවත්වා ගෙන යාම (තොටුපොළක්) | 500.00 | 750.00 | 1,000.00 |
| 46. | ජුකි මැෂින් පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 47. | සෙලියුලර් දුරකථන හා දුරකථන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 48. | පරණ යකඩ බඩු , ප්ලාස්ටික් භාණ්ඩ, හිස් බෝතල්, පත්තර, ගෝනි ගබඩා කර තැබීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 49. | පිගන් භාණ්ඩ (පෝසිලේන්, සිල්වර් භාණ්ඩ ඇතලු ) ගබඩා කර තැබීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 50. | සුරතල් මසුන් ඇති කිරීම, විකිණීම, හා මාළු ටැංකි සෑදීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 51. | රේස් මුදල් ඔට්ටු එකතු කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 52. | අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 53. | ක්‍රීඩා භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 54. | සිසිල් බීම ඒජන්සියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 55. | ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් (කුටියක්) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 56. | දැන්වීම් පුවරු ඇඳීම, ප්ලාස්ටික් අංක තහඩු සැකසීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 57. | යතුරු පැදි හා පාපැදි ආරක්ෂා කර දීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |
| 58. | වානේ ගෘහ භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 59. | මල් පැළ වර්ග, බෙහෙත් පැළ වර්ග හා වෙනත් පැලෑටි වර්ග විකිණීම හෝ තවාන් කිරීම හා ප්‍රදර්ශනය කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 60. | ලී බඩු හෝ වෙනත් ඕනෑම ජංගම විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම (දිනකට) | 500.00 | 750.00 | 1,000.00 |
| 61. | ස්ථාවර හා ජංගම දුරකථන සම්බන්ධතා නිකුත් කිරීමේ තාවකාලික වෙළඳ කුටියක් පවත්වා ගෙන යාම (දින 1 සිට 7 දක්වා) | - | - | 1,000.00 |
| 62. | බැංකු වලින් උකස් කර බේරා නොගත් භාණ්ඩ වෙන්දේසි කිරීමේදී එක් දිනකට අය කිරීම | 500.00 | - | - |
| 63. | ජංගම වෙළදාම කරත්තයක හෝ වාහනයක පවත්වා ගෙන යාම (වාර්ෂිකව) (කරවල, වියලි හෝ සැකසු ආහාර, පලතුරු වර්ග, එළවලු) | - | 750.00 | - |
| 64. | ඇලුමිනියම් භාණ්ඩ විකිණීම ගබඩා කර තැබීම | 500.00 | 750.00 | 1,000.00 |
| 65. | බලවේග යන්ත්‍ර මගින් නූල් නිෂ්පාදනය, පුලුන් සකස් කිරීම හා රෙදි විවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 66. | වායු සම්කරණ යන්ත්‍ර , ශිතකරණ , පරිගණක යන්ත්‍ර සෙලියුලර් දුරකථන අලුත්වැඩියා කරිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 67. | මෝටර් කොයිල් එතිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 68. | බෝට්ටු එන්ජින් අලුත්වැඩියා කරීමේ හා විකිණිම ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 69. | විදුලි බලයෙන් හෝ අත් යන්ත්‍ර මගින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 70. | ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනි යන්ත්‍ර, කැමරා වීඩියෝ , ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 71. | අතින් පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 72. | ගල් ස්මාරක, සිහිවටන පුවරු සෑදිමේ හෝ විකිණිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |
| 73. | විදුලි උත්පාදක යන්ත්‍ර (ජෙනරේටර්) කුලියට දීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 74. | කොහු මෝලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 75. | පොල් ලෙලි හා දැව පල් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 76. | හුණු වැරටි පිලිස්සිම සදහා පෝරණුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 77. | හම් වර්ග පදම් කරන කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |
| 78. | හම් වර්ග වලින් හෝ රබර් වර්ගවලින් භාණ්ඩ නිපදවිම හෝ විකිණිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 79. | රබර් බුෂ් සාදන වැඩ පලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 80. | රබර් දුම් ගෙයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 81. | ගිනිකෙළි භාණ්ඩ රතිඤ්ඤා නිපදවිම හෝ විකිණිම ගබඩා කිරීම පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 82. | වාහන ගෑස් කිරීම හෝ ගෑස් විකිණිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 83. | ගෑස් ගබඩා කිරීම හෝ විකිණිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 84. | රෙදි පින්තාරු කිරීම (බතික් වැඩ පලක් ) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 85. | ස්වාර්ණාභරණ නිපදවිම හා අලුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 86. | ස්වාර්ණාභරණ පාට කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 87. | මෙට්ට නිපදවිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 88. | සබන් නිපදවිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 89. | ලෝහ භාණ්ඩ නිපදවිම හා විකිණිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |

| | | | | |
|---|---|---|---|---|
| 90. | පිත්තල භාණ්ඩ නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 91. | ටයර් ටියුබ් වෝල්ක් නයිසිං කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 92. | අලුත් හෝ පරණ ටයර් ටියුබ් ගබඩා කිරීම කට්ටා කැපීම විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 93. | කොප්පරා නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම විකිණීම ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000,00 |
| 94. | වාහන ගාල් කර තැබීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 95. | පොල් තෙල් හැර වෙනත් තෙල් වර්ග නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 96. | බිත්තර සිල්ලරට හෝ තොග විකුණන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 97. | ග්‍රොසරියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 98. | මිරිස් ධාන්‍ය වර්ග, පිටි ඇඹරුම් හලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## නාගොඩ ප්‍රාදේශීය සභාව
## 2020 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ සහ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා යම් වෘත්තීන් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 2020 වර්ෂයේදී කර ගෙන යනු ලබන සෑම තැන්තෙකුම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබූ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවතින අවස්ථාවක එකී II තීරුවෙහි අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව ව්‍යාපාර බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් බද්දට යටත් තැනැත්තෙක්ම එකී ව්‍යාපාර බද්ධ 2020 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර නාගොඩ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට ගරු සභාවට යෝජනා කරමි.

**උපලේඛනය**

**වර්ෂය සඳහා ව්‍යාපාරයේ හෝ වෘත්තියේ ආදායම්** **අය කිරීමට තිරණය කල බදු මුදල (රු.)**

| | I වන තීරුව | II වන තීරුව |
|---|---|---|
| 1 | රු. 6000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2 | රු. 6000 ඉක්මවන එහෙත් රු. 12000 නොඉක්මවන අවස්ථාවක | 90.00 |
| 3 | රු. 12000 ඉක්මවන එහෙත් රු. 18750 නොඉක්මවන අවස්ථාවක | 180.00 |

| | | |
|---|---|---|
| 4 | රු.18750 ඉක්මවන එහෙත් රු. 75000 නොඉක්මවන අවස්ථාවක | 360.00 |
| 5 | රු. 75000 ඉක්මවන එහෙත් රු. 150000 නොඉක්මවන අවස්ථාවක | 1,200.00 |
| 6 | රු. 150000 ඉක්මවන අවස්ථාවක | 3,000.00 |

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## නාගොඩ ප්‍රාදේශීය සභාව
## 2020 වර්ෂයට අදාළව අක්කර බදු පැනවීම

### යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් නාගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගොඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිති පතා ගොවිතැනක් යටතේ වූද

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරක් ම මත 2020 වර්ෂය සඳහා රු 10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂය භාර ගරු ඇමතිතුමා විසින් නාගොඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) වන කොටසේ 1989.02.03 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති හෙයින් , හෙක්ටයාර එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2020 වර්ෂය සඳහා රුපියල් 50.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවිය යුතු යැයි යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## නාගොඩ ප්‍රාදේශීය සභාව

## 2020 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් බදු පැනවීම

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 1988 /08/23 වැනි දින අංක 520/7 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ iv (ආ) කොටසේ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වෙනි කොටසේ ප්‍රචාරක / දෘෂ්‍ය පරිසර පිළිබද අතුරු ව්‍යස්ථා විධිවිධාන ප්‍රකාර නාගොඩ ප්‍රාදේශිය සභා සිමාව තුළ යම් වීථියකට, පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරිමට සැලැස්වීම වෙනුවෙන් පහත උප ලේඛනයේ සදහන් බලපත්‍ර ගාස්තුවක් 2020 වර්ෂය සදහා පනවා 2020.01.01 සිට නාගොඩ ප්‍රාදේශිය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි

**උප ලේඛනය**

| | ප්‍රචාරක දැන්වීම් | (රු.) |
|---|---|---|
| 1 | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සදහා සෑම වර්ග අඩියකට (වර්ෂයකට) | 100.00 |
| 2 | බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සදහා වර්ග අඩියකට (මසකට) | 50.00 |

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## නාගොඩ ප්‍රාදේශීය සභාව

## 2020 වර්ෂයට ප්‍රසිද්ධ රග දැක්විමේ ආඥා පනත අනුව බදු පැනවීම

## යෝජනාව

ප්‍රසිද්ධ රග දැක්විමේ ආඥා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තු නාගොඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල 2020 වර්ෂයට පහත උපලේඛනයේ සදහන් පරිදි පනවනු ලබන ගරු සභාවට යෝජනා කරමි.

**උප ලේඛනය**

1 තාවකාලික චිත්‍රපට දර්ශනය, සර්කස් සංදර්ශන, මැජික් සංදර්ශන, නාට්‍ය සංදර්ශන හෝ වෙනත් යම් සංදර්ශනයක් සදහා **(රු.)**

එක් දිනකට බලපත්‍ර ගාස්තුව 1000.00

වැඩි වන සෑම දිනකටම 500.00

2 සංගිත සංදර්ශන සදහා එක් දිනකට 1000.00

3 ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් සියයට දහය (10%) විනෝද බද්ද

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## නාගොඩ ප්‍රාදේශීය සභාව

## 2020 වර්ෂය

**පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු, ආවරණ අනුමැතිය ලබා දීමේ ගාස්තු හා නාගොඩ ප්‍රාදේශීය සභාව සතු දේපල සහ නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන සේවා වෙනුවෙන් ගාස්තු අය කිරීම නිවාස සහ නගර සංවර්ධන ආඥා පනත අනුව**

**යෝජනාව**

නාගොඩ ප්‍රාදේශීය සභා බල සීමාව තුල සිදු කරනු ලබන සංවර්ධන කාර්යයන්ගෙන් සහ ඉඩම් අනුබෙදුම් මත අයකරනු ලබන පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු, ආවරණ අනුමැතිය ලබා දීමේ ගාස්තු සහ නාගොඩ ප්‍රාදේශීය සභාව සතු දේපල සහ නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන සේවා වෙනුවෙන් පහත උපලේඛනවල සඳහන් ආකාරයට 2020 වර්ෂයට ගාස්තු ගෙවිය යුතු බවට මෙයින් ගරු සභාවට යෝජනා කරමි.

**උපලේඛන 01** රු. ශත

| | |
|---|---|
| පර්චස් 06 සිට 20 දක්වා එක් කැබැල්ලකට | 250.00 |
| පර්චස් 21 සිට 40 දක්වා එක් කැබැල්ලකට | 300.00 |
| පර්චස් 41 සිට 60 දක්වා එක් කැබැල්ලකට | 400.00 |
| පර්චස් 61 සිට 120 දක්වා එක් කැබැල්ලකට | 450.00 |
| පර්චස් 121 සිට 160 දක්වා එක් කැබැල්ලකට | 500.00 |

පර්චස් 161 සිට වැඩිවන සෑම පර්චස් එකකට හෝ ඉන් කොටසකට රු 20 බැගින් අය කල යුතුය

**ගොඩනැගිලි ඉදි කිරීම මත ගාස්තු පැනවීම - 2020**

**උපලේඛන 02**

| ගොඩනැගිලි වල විශාලත්වය අනුව ගෙවීම | පදිංචිය සඳහා (රුපියල්) | වාණිජ හෝ වෙනත් කටයුත්තක් සඳහා (රුපියල්) |
|---|---|---|
| වර්ග මීටර් 45 ට අඩු | 150.00 | 300.00 |
| වර්ග මීටර් 45 - 90 | 250.00 | 500.00 |
| වර්ග මීටර් 91 - 180 | 500.00 | 1000.00 |
| වර්ග මීටර් 181 - 270 | 1000.00 | 2000.00 |
| වර්ග මීටර් 270 ට වැඩිවන සෑම වර්ග මීටර් 10 කට අමතරව එක්විය යුතු මුදල | 100.00 | 300.00 |
| මායිම් තාප්පයක් සඳහා (වර්ග මීටරයක් සඳහා) | 50.00 | 100.00 |

**විධිමත් බලපත්‍රයක් නොමැතිව කරනු ලබන ඉදිකිරීමක් හා භාවිතය වෙනස් කිරීමක් වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම සඳහා ගෙවිය යුතු ගාස්තු -2020**

**උපලේඛන 03**

| ඉදිකිරීම් අදියර | නේවාසික් වර්ග මීටර් එකක් සඳහා ගෙවිය යුතු ගාස්තුව | වාණිජ හෝ වෙනත් වර්ගමීටර් එකක් සඳහා ගාස්තුව |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| 1. අත්තිවාරම් මට්ටම | 20.00 | 50.00 |
| 2. වහල මට්ටම සඳහා ඉදිකොට ඇති විට | 40.00 | 100.00 |
| 3. වහල ඇතුලුව ඉදිකොට ඇති විට | 60.00 | 150.00 |
| 4. සම්පූර්ණයෙන් ඉදිකර ඇති විට | 100.00 | 200.00 |

මායිම් තාප්පයක් සඳහා දික් මීටරයකට රු 800.00 බැගින් (දික් අඩියකට රු. 250 බැගින්)

**ගොඩනැගිලි වල භාවිතය වෙනස් කිරීම සඳහා පෙරසැරි ගාස්තු**

**උපලේඛන 04**

| බිම් වර්ග ප්‍රමාණය | ගාස්තුව ( රුපියල්) |
|---|---|
| 500 දක්වා | 100.00 |
| 500 - 1 000 | 200.00 |
| 1001 - 2000 | 300.00 |
| 2001 - 3000 | 400.00 |
| 3001 - 5000 | 600.00 |
| 5001 - 7500 | 800.00 |
| 7501 - 10 000 | 1000.00 |
| 10 000 ට වැඩි | 1000 සහ ඉන් වැඩි වන සෑම අමතර වර්ග අඩි 100 ට හෝ ඉන් කොටසකට රු 50 බැගින් |

**නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් උඩුගම බහු කාර්ය ගොඩනැගිල්ල, ක්‍රීඩාංගන, ජල බවුසර්, වතුර ටැංකි, ටිප්‍රර් රථ, ට්‍රැක්ටරය කුලීයට දීම - 2020**

**එක් දිනක් සඳහා උඩුගම බහු කාර්ය ගොඩනැගිල්ල (පුටු 320 ක් සමග) ලබා දීමේ ගාස්තුව**

**උපලේඛන 05**

| | |
|---|---|
| පොදු කටයුතු සඳහා (රජයේ ආයතන, පාසල් සඳහා) | - රු. 10000.00 |
| පෞද්ගලික කටයුතු සඳහා | - රු. 15000.00 |
| තැන්පත් මුදල | - රු. 5000.00 |
| ජලය හා විදුලිය සඳහා | - රු. 1000.00 |

**ක්‍රීඩාංගන කුලියට දීමේ ගාස්තු**

**උපලේඛන 06**

| **ක්‍රීඩාංගනය** | **පොදු / රාජ්‍ය කටයුතු (රු.)** | **පෞද්ගලික කටයුතු (රු.)** |
|---|---|---|
| මාපලගම ක්‍රීඩාංගණය | 1000.00 | 1500.00 |
| උඩුගම ක්‍රීඩාංගණය | 1000.00 | 1500.00 |
| ගෝණදෙනිය ක්‍රීඩාංගණය | 1000.00 | 1000.00 |
| උඩුගම දකුණ ක්‍රීඩාංගණය | 1000.00 | 1000.00 |

**ජල බවුසර් සහ වතුර ටැංකි කුලියට දීමේ ගාස්තු**

**උපලේඛන 07**

| | ලීටර් 4000 (රු.) | ලීටර් **6000** (රු.) |
|---|---|---|
| එක් දිනකට සහා බල ප්‍රදේශය තුල අය කරන ගාස්තුව | 4000.00 | 6000.00 |
| එක් දිනකට සහා බල ප්‍රදේශයෙන් පිටත අය කරන ගාස්තුව | 5000.00 | 7000.00 |

**ටිපර් රථය කුලියට දීමේ ගාස්තු**

පැය 8 ක් සඳහා 50Km දක්වා රු. 8000.00

පැය 8 කට වැඩිවන සෑම පැයකට රු. 1000.00

50Km ට වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහාම රු. 200.00

**ට්‍රැක්ටරය කුලියට දීමේ ගාස්තු**

ට්‍රැක්ටර් පැයකට **5Km** දක්වා (ට්‍රේලරය සමඟ) - රු. 500.00

වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහාම - රු. 200.00

**වතුර රහිතව ලීටර් 2000 වැංකිය කුලියට දීමේ ගාස්තුව -එක් දිනක් සඳහා - රු. 1000.00**

**ආකෘති පත්‍ර සේවා සඳහා අය කරනු ලබන ගාස්තු**

**උපලේඛන 08**

1. වීථිරේඛා හා නොපවරා ගැනීමේ සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තු රු. 750.00
2. අන්තරාදායක කොස් ගසකට බලපත්‍ර දීම සඳහා ගාස්තුව රු. 1 000.00
3. අන්තරාදායක වෙනත් ගසක් සඳහා බලපත්‍ර දීමේ ගාස්තු රු. 500.00
4. දේපළ අයිතිය සනාථ කිරීමේ සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තුව රු. 200.00
5. ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ගාස්තු රු. 500.00
6. නැවත බලපත්‍ර අලුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු රු. 500.00
7. වෙනත් සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තුව රු. 200.00

8. මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව රු. 500.00
9. පාරිසරික බලපත්‍ර ඉල්ලුම්පත් ගාස්තු රු. 100.00
10. ජල නළ එළීම සඳහා පාරවල් පලුදු කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු රු. 200.00
11. ජල නළ එළීම සඳහා පාරවල් පලුදු කිරීමේ පෙරසැරි ගාස්තු රු. 500.00

12. අනුමත ගොඩනැගිලි සැළසුම් කාලය දීර්ඝ කිරීමට අදාළ ගාස්තු
   a. පළමු අවුරුද්ද සඳහා රු. 150.00
   b. දෙවැනි අවුරුද්ද සඳහා රු. 200.00
   c. තෙවනි අවුරුද්ද සඳහා රු. 250.00

(උපරිම කාලය දීර්ඝ කිරීම වර්ෂ 03 ක් පමණි)

13. ඉඩමක් වෙන්දේසි කිරීමක් සඳහා අය කරන ගාස්තුව
   a. සංවර්ධන බලපත්‍රයක් ලබා ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තුව රු. 100.00
   b. සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු රු. 1000.00
   c. කැබලි සැළසුම් අනුමත කිරීමේ අයදුම්පත් ගාස්තු රු. 500.00
   d. කැබලි සැළසම් අනුමත කිරීමේ පෙරසැරි ගාස්තුව (ඉඩමේ ඔප්පුවේ වටිනාකම අනුව)
      (අ.) රු. 25,000.00 හෝ ඊට අඩු වන විට රු. 1000.00
      (ආ.) රු. 25,001 සිට රු. 500,000.00 දක්වා රු. 3000.00
      (ඇ.) රු. 500,001.00 සිට රු. 1,000,000.00 රු. 5000.00
      (ඈ.) රු. 1,000,000.00 ට වැඩි රු. 8000.00
   e. කැබලි සැළසුම් අනුමත කිරීමේ ගාස්තු (කැබැල්ලකට) රු. 200.00
   f. කැබලි සැළසුම් හා අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තු රු. 1000.00

14. පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු රු. 50.00
15. පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු (පොත් දෙකටම) රු. 2.00
16. පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු රු. 25.00

**දුරකථන කුලුණු හා විකාශන මධ්‍යස්ථාන සඳහා ගාස්තු**

1. දුරකථන කුලුණු හා විකාශන මධ්‍යස්ථාන වල සැලැස්ම අනුමත කිරීමේදී භූමියේ වර්ග අඩියක් සඳහා අයකරන ගාස්තු රු. 50.00
2. කුලුණේ පලමු මීටර් 10 නිදහස් වන අතර ඊට වැඩි වන මීටරයකට රු. 2 500.00
3. පරීක්ෂණ ගාස්තු රු. 1 000.00
4. වාර්ෂික ව්‍යාපාර බද්ද රු. 3000.00

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## ඉඩම් විකිණීම මත බදු පැනවීම 2020

## යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 154 (1) වගන්තිය යටතේ නාගොඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් ප්‍රසිද්ධව වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැවුකරු හෝ ඔහුගේ සේවකයා අනුයෝජිතයා විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## 2020 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළබඳ බද්ද

## යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ අංක 148 වැනි වගන්ති යටතේ පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් අනු ප්‍රමාණ අනුව වාහන හා සතුන් පිළිබඳ බද්දක් 2020 වර්ෂය සඳහා නියම කිරීමට යෝජනා කල බව එකී පනතේ 147 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලබන අතර 148 (3) වැනි වගන්තිය යටතේ බදු මුදල 2020 ජුනි මස 30 දිනට පෙර ගෙවිය යුතු බවට ගරු සභාවට යෝජනා කරමි.

**උප ලේඛනය**

| | | |
|---|---|---|
| 1 | බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන වාහනයක් සඳහා | - රු. 25.00 |
| 2 | පාපැදිය වෙළඳ කාර්යයක් සඳහා යොද වන්නේ නම් | - රු. 18.00 |
| 3 | පාපැදිය වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | - රු. 4.00 |

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

iii. බල ප්‍රදේශයේ නාගරික සීමාව තුල සංවර්ධන කටයුතු සඳහා ඉඩමක අවම ප්‍රමාණය තීරණය කිරීමට අදාලව,නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාගොඩ,යටලමත්ත, උඩුගම,මාපලගම,තල්ගස්වල යන නගරික ප්‍රදේශ දිනෙන් දින නාගරීකරණය වන බැවින් එම නාගරික ප්‍රදේශ තුල පවතින ඉඩම්වල භූමි ප්‍රමාණය අඩු හෙයින් එම ඉඩම් නීත්‍යානුකූල කර ගැනීමට නොහැකිව ඇත.එම ඉඩම් නීත්‍යානුකූල කර ගැනීමට අදාලව නාගරික සංවර්ධන අධිකාරියේ අනුමත අවම බිම් ප්‍රමාණයන් සැලකිල්ලට ගෙන ඉදිරියේදී නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමට හැකියාව ඇති හෙයින් පහතින් සඳහන් කරනු ලබන හදුනාගත් නාගරික සීමාවන් තුල පමණක් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා කැබැල්ලක අවම බිම් ප්‍රමාණයන් පහත පරිදි යෝජනා කරමි.

- ❖ වාණිජ භාවිතය සඳහා නාගරික සීමාව තුල අවම බිම් ප්‍රමාණය පර්චස් 06 ක් ලෙසත් එම පර්චස් 06 ක ඉඩමෙහි අවම පළල මීටර් 06 ක්(අඩි 20)ක් විය යුතු බව හා
- ❖ නේවාසික භාවිතය සඳහා ඉඩමෙහි ප්‍රමාණය අවමය පර්චස් 10 ක් විය යුතු බවත්ය.

❖ පහත සදහන් කරන ලද නාගරික ප්‍රදේශයේ පෙන්වා ඇති සීමාවන් දක්වා ඇති මාර්ගවල, මාර්ගයේ මධ්‍යයේ සිට දෙපසින් මීටර් 100 ක ප්‍රමාණයක් බැගින් බවත්ය.

හදුනාගත් නාගරික සීමාව පහත පරිදි වේ.

නාගොඩ නාගරික සීමාව

| | | |
|---|---|---|
| නාගොඩ හංදිය :- | නාගොඩ - මාපලගම පාර | කුරුපනාව බස් නැවතුම් පොළ දක්වා |
| | නාගොඩ - ගාල්ල මාර්ගය | නාගොඩ ප්‍රාදේශීය සභාව දක්වා |
| | නාගොඩ - ගම්මැද්දෙගොඩ මාර්ගය | නව පාලම දක්වා |
| | නාගොඩ - බද්දෙගම මාර්ගය | - නැත |

යටලමත්ත නාගරික සීමාව

| | | |
|---|---|---|
| යටලමත්ත හංදිය :- | යටලමත්ත - උඩුගම මාර්ගය | මීටර් 250 ක් දුරට |
| | යටලමත්ත - ගාල්ල මාර්ගය | මීටර් 250 ක් දුරට |
| | යටලමත්ත - නාගොඩ මාර්ගය | මීටර් 250 ක් දුරට |

උඩුගම නාගරික සීමාව

| | | |
|---|---|---|
| බාර් හංදිය :- | බාර් හංදිය - දෙල්ලව මාර්ගය | කැටගොඩ බස් නැවතුම් පොළ දක්වා |
| | බාර් හංදිය - ගාල්ල මාර්ගය | උඩුගම ඩිපෝව දක්වා |
| | බාර් හංදිය - බද්දෙගම මාර්ගය | ගෝනදෙණිය පාසල අසල බස් නැවතුම් පොළ දක්වා |

මාපලගම නාගරික සීමාව

| | | |
|---|---|---|
| මාපලගම හංදිය :- | මාපලගම - තල්ගස්වල මාර්ගය | මීටර් 200 ක් දක්වා |
| | මාපලගම - පනංගල පාර | ආසිරි සර්විස් අසල ඇල මාර්ගය දක්වා |
| | මාපලගම - නාගොඩ මාර්ගය | මහ පාලම දක්වා |

තල්ගස්වල නාගරික සීමාව

| | | |
|---|---|---|
| තල්ගස්වල පොළ ඉදිරිපස :- | තල්ගස්වල - මාපලගම පාර | කුඹුරුහේන මාර්ගයට හැරෙන ස්ථානය දක්වා |
| | තල්ගස්වල - ඇල්පිටිය පාර | නාගොඩ ප්‍රාදේශීය සභා සීමාව දක්වා |
| | තල්ගස්වල - පිටිගල පාර | නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දක්වා |

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී සී. වනිගරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.**

මෙම යෝජනාව සම්බන්දයෙන් ගරු සභාපතිතුමා ගරු සභාවේ අදහස් විමසන ලදී. ඒ අනුව ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා අදහස් දක්වමින්,මෙම යෝජනාව ඉතාම හොද යෝජනාවක් බවත්,උඩුගම නගරය පැතිරුන නගරයක් බැවින් බාර් හංදියේ සිට ගල්ලන්දල සහා සීමාව දක්වාත් ගාලු පාරේ අලුත්වත්ත හංදිය දක්වාත් සීමාවන් සංශෝධනය විය යුතු බවට යෝජනා කරන ලදී.එම යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරනලදී. ඉහත සංශෝධන සුදුසු බව හා කාලෝචිත බව දක්වමින් ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත්, ගරු මන්ත්‍රී තරංග සුදර්ශන, ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න යන මහත්වරු අදහස් දැක්වීය.

ඒ අනුව ඉහත පෙන්වාදුන් සංශෝධනයන් සිදු කරමින් ගරු සභාපතිතුමා විසින් නැවත සංශෝධිත යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

බල ප්‍රදේශයේ නාගරික සීමාව තුල සංවර්ධන කටයුතු සදහා ඉඩමක අවම ප්‍රමාණය තීරණය කිරීමට අදාලව, නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාගොඩ,යටලමත්ත, උඩුගම,මාපලගම,තල්ගස්වල යන නාගරික ප්‍රදේශ දිනෙන් දින නාගරීකරණය වන බැවින් එම නාගරික ප්‍රදේශ තුල පවතින ඉඩම්වල භූමි ප්‍රමාණය අඩු හෙයින් එම ඉඩම් නීත්‍යානුකූල කර ගැනීමට නොහැකිව ඇත. එම ඉඩම් නීත්‍යානුකූල කර ගැනීමට අදාලව නාගරික සංවර්ධන අධිකාරියේ අනුමත අවම බිම් ප්‍රමාණයන් සැලකිල්ලට ගෙන ඉදිරියේදී නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමට හැකියාව ඇති හෙයින් පහතින් සදහන් කරනු ලබන හදුනාගත් නාගරික සීමාවන් තුල පමණක් ගොඩනැගිලි ඉදි කිරීම සදහා කැබැල්ලක අවම බිම් ප්‍රමාණයන් පහත පරිදි යෝජනා කරමි.

- ❖ වාණිජ භාවිතය සදහා නාගරික සීමාව තුල අවම බිම් ප්‍රමාණය පර්චස් 06 ක් ලෙසත් එම පර්චස් 06 ක ඉඩමෙහි අවම පළල මීටර් 06 ක්(අඩි 20)ක් විය යුතු බව හා
- ❖ නේවාසික භාවිතය සදහා ඉඩමෙහි ප්‍රමාණය අවමය පර්චස් 10 ක් විය යුතු බවත්ය.
- ❖ පහත සදහන් කරන ලද නාගරික ප්‍රදේශයේ පෙන්වා ඇති සීමාවන් දක්වා ඇති මාර්ගවල, මාර්ගයේ මධ්‍යයේ සිට දෙපසින් මීටර් 100 ක ප්‍රමාණයක් බැගින් බවත්ය.

<u>හදුනාගත් නාගරික සීමාව පහත පරිදි වේ.</u>

<u>නාගොඩ නාගරික සීමාව</u>

| | | |
|---|---|---|
| නාගොඩ හංදිය :- | නාගොඩ - මාපලගම පාර | කුරුපනාව බස් නැවතුම් පොළ දක්වා |
| | නාගොඩ - ගාල්ල මාර්ගය | නාගොඩ ප්‍රාදේශීය සභාව දක්වා |
| | නාගොඩ - ගම්මැද්දෙගොඩ මාර්ගය | නව පාලම දක්වා |
| | නාගොඩ - බද්දෙගම මාර්ගය | නැත |

<u>යටලමත්ත නාගරික සීමාව</u>

| | | |
|---|---|---|
| යටලමත්ත හංදිය :- | යටලමත්ත - උඩුගම මාර්ගය | මීටර් 250 ක් දුරට |
| | යටලමත්ත - ගාල්ල මාර්ගය | මීටර් 250 ක් දුරට |
| | යටලමත්ත - නාගොඩ මාර්ගය | මීටර් 250 ක් දුරට |

උඩුගම නාගරික සීමාව

| | | |
|---|---|---|
| බාර් හංදිය :- | බාර් හංදිය - දෙල්ලව මාර්ගය | ගල්ලන්දල සහා සීමාව දක්වා |
| | බාර් හංදිය - ගාල්ල මාර්ගය | අලුත් වත්ත හංදිය දක්වා |
| | බාර් හංදිය - බද්දෙගම මාර්ගය | ගෝනදෙණිය පාසල අසල බස් නැවතුම් පොළ දක්වා. |

මාපලගම නාගරික සීමාව

| | | |
|---|---|---|
| මාපලගම හංදිය :- | මාපලගම - තල්ගස්වල මාර්ගය | මීටර් 200 ක් දක්වා |
| | මාපලගම - පනංගල පාර | ආසිරි සර්විස් අසල ඇල මාර්ගය දක්වා |
| | මාපලගම - නාගොඩ මාර්ගය | මහ පාලම දක්වා |

තල්ගස්වල නාගරික සීමාව

| | | |
|---|---|---|
| තල්ගස්වල පොළ ඉදිරිපස :- | තල්ගස්වල - මාපලගම පාර | කුඹුරුහේන මාර්ගයට හැරෙන ස්ථානය දක්වා |
| | තල්ගස්වල - ඇල්පිටිය පාර | නාගොඩ ප්‍රාදේශීය සහා සීමාව දක්වා |
| | තල්ගස්වල - පිටිගල පාර | නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දක්වා |

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් සංශෝධිත යෝජනාව ගරු මන්ත්‍රී සී. වනිගරත්න මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

iii. 2020 වර්ෂය සඳහා නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් තල්ගස්වල බදාදා සති පොළ, උඩුගම සදුදා සති පොළ සහ උනන්විටිය අගහරුවාදා සති පොළ ටෙන්ඩර් කිරීමට සහ අවම ලංසුව තීරණය කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය**

iv. MP 2001 L ඡායා පිටපත් යන්ත්‍රයේ සේවා ගිවිසුම 2019.10.01- 2020.09.30 දක්වා කාලය සඳහා අලුත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය**

v. PF 7360 දරන කැබ් රථයේ ටියුන්අප් කිරීම සහ ටී බෙල්ට් එක දැමීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය**

vi. උඩුගම උප කාර්යාල ගොඩනැගිල්ල උක්ඕවිට පෙර පාසල පවත්වා ගෙන යාමට හැකි වන පරිදි සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය**

vii. උසස් පෙළ දේශපාලන විද්‍යාව නව විෂය නිර්දේශයට අයත් පොත්වල පිටපත් ප්‍රාදේශීය සභා පුස්තකාල සඳහා ලබා ගැනීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

viii. **ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 30 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීමට යෝජනා කරමි.**

**2019.10.08 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.**

**01.2019 සැප්තැම්බර් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 4507357802 | - සමනළ පෙර පාසල | - රු. 697.50 |
| 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - රු. 313.20 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු. 8923.00 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1996.80 |
| 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු. 294.90 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 1008.60 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු. 1356.30 |
| 8617046104 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය | - රු. 1594.20 |

**02. සී/ස ලංකාබෙල් පුද්ගලික සමාගම**
උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම (2019.08.16- 2019.09.15) - රු. 688.51

**03. මොබිටෙල් පුද්ගලික සමාගම**
පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාවේ බිල්පත පියවීම (2019.09.25) - රු. 68.86

**04.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**
33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2019.08.21 – 2019.09.21) -රු. 2787.98

**05. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. ගෝණදෙනිය පිට්ටනිය සම්බන්ධ එල් 36 නඩුවේ මුද්දර ගාස්තු සඳහා වූ වියදම ලබා දීම - රු. 1000.00

**06. අතිකාල දීමනා ගෙවීම**

**2019 සැප්තැම්බර් මස**

| | | |
|---|---|---|
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 8031.00 |
| බී.ජී.පියතිලක මයා | - රියදුරු | - රු. 8031.00 |

| | | |
|---|---|---|
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 6886.82 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 7680.00 |
| යසරත්න විජේසේකර | - මුරකරු | - රු. 9176.25 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8360.00 |
| එන්.එම්.රජිත මයා | -අනියම් මුරකරු | - රු. 8080.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර | - අනියම් රියදුරු | - රු. 7628.50 |

**<u>07 .2019 සැප්තැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ  මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු.  5240.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 5430.00 |

**<u>08. 2019 ඔක්තෝම්බර් මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| කේ.කේ. අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු.  700.00 |

**<u>2019 සැප්තැම්බර් මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන | - ගරු සභාපති | - රු. 5000.00 |
| සී. දයාවංශ මිය | - ලේකම් | - රු. 1000.00 |
| කුසල් එදිරිසිංහ මයා | - තාක්ෂණ නිලධාරී | - රු.  848.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු.  920.00 |
| කේ.කේ. අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1870.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 3500.00 |
| මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු.  700.00 |
| බී.ජී.පියතිලක මයා | - රියදුරු | - රු.  700.00 |
| පී. සමන් ප්‍රදීප් මයා | - සෞඛ්‍ය කම්කරු | - රු.  820.00 |
| ඩබ්.ජී. දයානන්ද මයා | - සෞඛ්‍ය කම්කරු | - රු.  820.00 |

**<u>පුහුණු වැඩසටහන් සඳහා</u>**

| | | |
|---|---|---|
| සී. දයාවංශ මිය | - ලේකම් | - රු. 2180.00 |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 1760.00 |

**<u>09. 2019 අගෝස්තු මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| ඉරේෂා මල්කාන්ති මදනායක | - සංවර්ධන නිලධාරී | - රු.  500.00 |
| මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු.  700.00 |
| බී.ජී.පියතිලක මයා | - රියදුරු | - රු.  700.00 |

**<u>2019 ජූලි මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියැලීම වෙනුවෙන්</u>**

කුසල් එදිරිසිංහ මයා - තාක්ෂණ නිලධාරි - රු. 700.00

**10. යූ.කේ.ජයන්ත මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2019/09/06) - රු. 600.00

**11. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව**

විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිඟ විගණන ගාස්තු ගෙවීම - රු. 10155.00

**12.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය**

**<u>2019 අගෝස්තු මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 79 ක් | - රු. 8216.00 |
| LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 50 ක් | - රු. 5200.00 |
| ඩෙංගු මර්ධන කටයුතු සඳහා පෙට්‍රල් ලීටර් 8 | - රු. 1104.00 |
| ඩෙංගු මර්ධන කටයුතු සඳහා ඩීසල් ලීටර් 40 | - <u>රු. 4160.00</u> |
| **එකතුව** | **- <u>රු. 18680.00</u>** |

**13.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය**

**<u>2019 සැප්තැම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 40 ක් | - රු. 4160.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 30 ක් | - රු. 3120.00 |
| LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 50 ක් | - රු. <u>5200.00</u> |
| **එකතුව** | **- <u>රු. 12480.00</u>** |

**14. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2019 සැප්තැම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 600ක් | - රු. 62400.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 110 ක් | - රු. 11440.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 245 ක් | - රු. 25480.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 70 ක් | - රු. 7280.00 |
| ජලභීතිකා මර්ධන වැඩසටහන සඳහා පෙට්‍රල් ලීටර් 21 | - රු. 2877.00 |
| තණකොළ කපන මැෂිම සඳහා පෙට්‍රල් ලීටර් 20 | - රු. 2760.00 |
| 2 T Oil ලීටර් 01 - | - <u>රු. 620.00</u> |
| **එකතුව** | **- <u>රු.112857.00</u>** |

**15.හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, කොටුව, ගාල්ල**

i. නඩු අංක එල් 36 ට අදාළව 2019.09.17 කැඳවන ලද නඩු වාරය සඳහා නීතිඥ පෙනී සිටීමේ ගාස්තු -රු. 5000.00

**16.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2019 ඔක්තෝම්බර් මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු.28500.00
ii. 2019 සැප්තැම්බර් මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම්- රු. 1890.00

**17. ඒ.ඩී. කරුණාරත්න මයා ,සරත් ස්ටෝර්ස්, යටලමත්ත**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2019 සැප්තැම්බර් - රු. 7380.00

**18.එම්.ඒ. සිරිපාල මයා, සේසිරි ස්ටෝර්ස්, මාපලගම**

මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2019 අගෝස්තු - රු. 2530.00
2019 සැප්තැම්බර් - රු. 2570.00

**19. එච්.එල්.කේ. ශ්‍රීනිත් රුක්ෂාන්, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2019 සැප්තැම්බර් - රු. 5160.00

**20. බුද්ධික කරුණාරත්න, රත්නගිරි ස්ටෝර්ස්, මාපලගම**

මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2019 අගෝස්තු - රු. 5270.00
2019 සැප්තැම්බර් - රු. 5390.00

**21. මුතුහෙට්ටිගම ටයර් සෙන්ටර් ඇන්ඩ් මෝටර් ස්ටෝර්ස්, උ ඩුගම**

i. LL 7103 දරණ ටිපර් රථය සඳහා ඔයිල් ලීටර් 2 ක් ලබා ගැනීමේ බිල්පත - රු. 860.00

**22. දයානි පුද්. සමාගම, මාපලගම**

උඩුගම පොළේ වහළ අළුත්වැඩියා කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම - රු. 1130.00

**23. එක්සලන්ට් ඇඩ්ස් ඇන්ඩ් කාර් කෙයාර්, තල්ගස්වල**

යටලමත්ත පාලම අවදානම් බව දැන්වීම සඳහා අවදානම් දැන්වීම් පුවරුව
සකස් කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 810.00

**24. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල
බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා ඔක්තෝම්බර් මස මාසික කුලීය ගෙවීම- රු.4000.00

**25. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2019 සැප්තැම්බර්) - රු.13000.00

**26. අතුකෝරල මුද්‍රණ ශිල්පියෝ, පිටිගල**

ලදු පත් පොත් 100 ක් මුද්‍රණය කිරීමේ ගාස්තු - රු.17250.00

**27. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, ගා/ නාගොඩ**

i. 2019 සැප්තැම්බර් මස 10 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (තේ සඳහා) - රු. 2757.00

**28. ආර්. ඒ. රංජිත් මානෙල් මයා, සීගිරි හොටෙල්, නාගොඩ**

i. 2019 සැප්තැම්බර් මස 10 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (කෑම සඳහා) - රු. 4660.00

<u>**පොදු අරමුදල් කර්මාන්ත**</u>

**29. එස්.ඩබ්.සී.ප්‍රියදර්ශනී, උඩුගම දකුණ**

i. හෝමදොළ තුම්මෝදර ක්‍රීඩාපිටිය ජේ.සී.බී. යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම - රු.14800.00

ii. උඩුගම දකුණ පියතිලක මාවත මිනිරන්වල කන්ද මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 7500.00

<u>රජයේ ආධාර</u>

**මන්ත්‍රී ප්‍රතිපාදන 2016 - යූ.ජී.ඩී.ආරියතිලක** මැතිතුමා

**30. පළාත් පාලන කොමසාරිස්, දකුණු පළාත**

උඩුගම ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරස්ථානයේ ප්‍ර වේශ මාර්ගය සංවර්ධනය කර මුදල් ගෙවීමෙන් පසු ඉතිරි වූ මුදල් නැවත ගෙවීම - රු. 34652.79

**ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් යෝජනා කළ අතර ගරු මන්ත්‍රීනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**(ඉ) 2.1. ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ඉදිරිපත් කරන යෝජනා**

i. නිතර ජල ගැලීම් නිසා මාපලගම 215 බී ග්‍රාම සේවක වසමට ලී බෝට්ටුවක් ලබා දීම

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

<u>**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**</u>

| | | |
|---|---|---|
| **i.** | ගෝණදෙනිය දිසානායක මාවත කාපට් කිරීම | රු. 127,555,686.77 |
| **ii.** | ගෝණදෙනිය යහලදූවවත්ත පාර ප්‍රතිසංස්කරණය කිරීම | රු. 1,107,802.55 |
| **iii.** | ඇඩ්වින් මයාගේ නිවස අසල සිට ජයවීර මයාගේ නිවස අසළ දක්වා වූ ගහ අද්දර මාර්ගය මීටර් 100 ක් පමණ කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම | රු. 750,000.00 |
| iv. | උඩුගම ළමා උද්‍යානය ඉදි කිරීම | රු. 1,800,000.00 |
| v. | මාපලගම ළමා උද්‍යානය ඉදි කිරීම | රු. 3,200,000.00 |

**ඉහත සඳහන් මාර්ග සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>සංශෝධිත ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම</u>**

**<u>2019.09.10 දින මහා සභාවට ඉදිරිපත් කරන ලද පහත සඳහන් ඇස්තමේන්තු වල මුදල් සංශෝධනයන් සහිතව පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද ඇස්තමේන්තු</u>**

| | | |
|---|---|---|
| i. | තලංගහවත්තේ බොතේජු ඉහළ කොටසේ පෙරෙට්ටු මඩුව අසළ සිට ශ්‍රී මුත්තුමාරි දේවාලයට යන පාර කොන්ක්‍රීට් කිරීම | රු. 615000.00 |
| ii. | ගෝණදෙනිය මාවත දෙවන අතුරු මාර්ගය අනුර ජාගොඩ මහතාගේ නිවස අසළ සිට ඉදිරියට ප්‍රතිසංස්කරණය කිරීම | රු. 615000.00 |
| iii. | උඩුගම හෝමදොලවත්ත ස්ටොක්ලන්ඩ් කොටසේ උඩුගම පාසල අසළ සිට ස්ටොක්ලන්ඩ් වතුයායේ පල්ලියට සහ කෝවිලට යන පාර කොන්ක්‍රීට් කිරීම | රු. 615000.00 |
| iv. | එම්.එච්.එම්.ප්‍රේමදාස මහතාගේ නිවස අසළ සිට ඉදිරියට ඇති නාගොඩ ඉහළ අන්නාසිගලහේන අතුරු මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | රු. 615000.00 |
| v. | උක්ඕවිට සිට බටහේන්ගොඩ දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | රු. 615000.00 |
| vi. | නාගොඩ උඩුගම ගෝණදෙනියට අයත් හිරිඹුරවත්ත පාසල්ගොඩකන්ද මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | රු. 515000.00 |
| vii. | නාගොඩ වළකුඹුර 70 කන්ද මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | රු. 615000.00 |
| viii. | ගෝණදෙනිය දිසානායක මාවතේ තුංමංහන්දියේ සිට ටී.ජී. බුද්ධික මහතාගේ නිවාසය දක්වා ප්‍රතිසංස්කරණය කිරීම | රු. 515000.00 |

**ඉහත සඳහන් මාර්ග සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**නැත.**

**(ඊ) කාරක සභා වාර්තා**

නැත

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2019 සැප්තැම්බර් මාසයට අදාල මාසික ඒකාබද්ධ ආදායම් සාරංශය සළකා බැලීම සඳහා ඔක්තෝම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

- ❖ 2019 සැප්තැම්බර් මාසයට අදාල මාසික ඒකාබද්ධ වැය සාරංශය සළකා බැලීම සඳහා ඔක්තෝම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- ❖ 2019 සැප්තැම්බර් මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් සළකා බැලීම සඳහා ඔක්තෝම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමනි, තල්ගස්වල පොලට ඇතුළු වන ස්ථානයේ ආවරණය කරලා තියන කොන්ක්‍රීට් තහඩු ගැලවිලා තියෙනවා. ඒ නිසා පොළ ඇතුලට වාහනයක් ඇතුල් කරන්න බැහැ. ඒ ගැන අවධානය යොමුකරන්න. ඒ වගේම අපේ කුඹුරුහේන ප්‍රදේශයේ මල ගෙයක් තියෙනවා. තාවකාලිකව අද දවස තුල විදුලි බල්බ දෙකක් සවි කරලා දෙන්න. මොකද රාත්‍රි කාලයේදී ඒ හරිය පාර ගොඩක් අඳුරුයි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුලු ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමියනි, ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා විසින් ගෝණදෙනිය ක්‍රීඩාපිටිය රජයට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් මීට පෙර ඔය ක්‍රීඩා පිටි හා අප භුක්ති විදින දේපළ අපේ අයිතියට පවරා ගන්න කියලා යෝජනා ඉදිරිපත් වෙලා තිබුණා. එම තොරතුරු පළාත් පාලන දෙපාර්තමේන්තුව විසිනුත් අපගෙන් ඉල්ලා තිබුණා. එම අවස්ථාවේ සියළුම මන්ත්‍රීවරුන් මේ සම්බන්ධව දැනුවත් කරලා, යෝජනා ලබා ගෙන අදාළ ආයතනවලට යොමු කළා. මේ සම්බන්ධව අපි යොමු කරන ලද ඉල්ලීම සම්බන්ධව ප්‍රගතිය සොයා බලන්න කියලා මම ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා. මෙම යෝජනාව කලින් ඉදිරිපත් වුන යෝජනාවක් නිසා මෙම යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුලත් කරන්න කටයුතු කලේ නැහැ.
ඒ වගේම ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ගල්ලෙනමුල්ල මාර්ගය ඉතා අබලන් තත්වයක පවතින බැවින්, එම නිසා කපිල මහතාගේ නිවස දක්වා කොරිපස් යොදා සකස් කරලා දෙන්න කියලා ඉදිරිපත් කර තිබූ යෝජනාව මීට පෙර ලක්රුවන් මන්ත්‍රීතුමා විසින් සභාවට ඉදිරිපත් කර තිබූ නිසා න්‍යාය පත්‍රයට ඇතුලත් කළේ නැහැ. තවද, ජයවීර මන්ත්‍රීතුමා තල්ගස්වල සිට දියවර ගම්මාන මාර්ගය ගිලා බැස ඇති බැවින් පැති බැම්මක් යොදා සකස් කර දෙන ලෙස ඉදිරිපත් කර තිබූ යෝජනාවද මීට පෙර සභා වාරයකට ඉදිරිපත් වී ඇති බැවින් එම යෝජනාවද න්‍යාය පත්‍රයට ඇතුලත් කළේ නැහැ. ඒ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියටත් දන්වලා තියෙන්නෙ. ඒ වගේම ජයවීර මන්ත්‍රීතුමාගේ කොළඹ කඩේ සිට කුඹුරුහේන මාර්ගයේ කුඹුස්ස පාලම ගිලා බැස ඇත. එය තාවකාලිකව යකඩ තහඩුවක් යොදා සකස් කිරීමට බලධාරීන් දැනුවත් කරන ලෙස කරන ලද යෝජනාවද මීට පෙර යෝජනා වී, ප්‍රාදේශීය සභාව මගින් අදාළ ස්ථානය පරික්ෂා කර බලා ඇස්තමේන්තුවක්ද සකස් කර අදාල බලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කර ඇත. එම නිසා මෙම යෝජනාවද න්‍යාය පත්‍රයට ඇතුලත් කලේ නැහැ. ඉහත සඳහන් යෝජනා ඉවත් කලේ කුමන හේතුවක් නිසාද කියලා ගරු සභාව දැනුවත් වෙන්න ඕන නිසයි කිව්වෙ.

ඒ වගේම අපේ පුරනැගුම ව්‍යාපෘතිය මගින් ඉදිකරන ලද උඩුගම බහුකාර්යය මධ්‍යස්ථානයේ ජලනල ප්‍රශ්නය අදාල කොන්ත්‍රාත්කරුටම කියලා විසඳුවා. ගරු උප සභාපතිතුමනි, ඊළඟට අනතුරුදායක ගස්

ඉවත් කිරීම  ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ. ගරු මන්ත්‍රීවරුනි, අපේ සභාව අනතුරුදායක ගස් ඉවත් කිරීමේ ක්‍රමවේදය ගැනත් අවධානය යොමු වෙන්න ඕන. මොකද ගරු සමන් මන්ත්‍රීතුමා නිතරම කියන අනතුරුදායක ගහටත් තවම විසඳුමක් දීගන්න බැරි වුනා.  අදාල ගස් හිමියන් ගස් කැපීම නොකරන නිසා එම අනතුරුදායක ගස් ඉවත් කිරීම සභාවේ සේවකයන් ලවා සිදු කොට ඒවාට යන වියදම ගස් හිමියන්ගෙන් අය කර ගැනීමට වෙනවා.මේ කටයුතු සිදු කිරීමෙදි සභාවට විශාල වියදමක් දැරීමට මෙන්ම එම කාර්යය කිරීමට පුහුණු සේවකයන් නොමැති වීමද විශාල ප්‍රශ්නයක් නිසා මා අපහසුතාවයට පත්වෙන අවස්ථා තියෙනවා. එබැවින් මෙම කාර්යයන් ඉටු කිරීමෙදි සියළුම පාර්ශවයන් සමග සුහදව කටයුතු කොට එම අවහිරතාවයන් ඉවත් කිරීමයි මගේ බලාපොරොත්තුව. ඒ එක්කම මේ දිනවල කෙරෙන මාර්ග සංවර්ධනයේදී බොහොමයක් මාර්ග වගේම අපේ ප්‍රාදේශීය සභා මාර්ග සංවර්ධනය වෙනවා. ඒ අතරතුර අනිත් අතුරු මාර්ග කැලෑවලින් වැසිලා තියෙනවා. නමුත් අපට සේවකයන්ගේ අඩුවත්, කාලගුණයත් එක්ක මේ කටයුතු කිරීමේදී අපි අපහසුතාවයකට පත්වෙලා තියෙනවා. මොකද මම ඒ ගැන මතක් කළේ අපේ මන්ත්‍රීවරු නිතරම ඒ ගැන අපට දැණුම් දෙන නිසා.

ඒ වගේම අපි ගරු මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියන්ලාට දැනුම් දෙන්න ඕන. ඔක්තෝම්බර් පළවෙනිදා ළමා දින උත්සවයක් තියන්න බලාපොරොත්තුවෙන් හිටියේ. නමුත් කාලගුණය අයහපත් වීම නිසා අපට ඒ කටයුත්ත කරන්න බැරිවුණා. මේ එන දාහත් වෙනිදා මාපලගම ක්‍රීඩාංගනයේ උත්සවශ්‍රීයෙන් අපි ඒ කටයුත්ත කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා වියදම සභාවේ අරමුදලෙන් ලබා ගැනීමට අදහස් කර තිබුනත්, මම බලාපොරොත්තු වෙනවා පරිත්‍යාග ශීලීන්ගෙන් එම වියදම පියවා ගැනීමට. සභාවේ මූල්‍ය තත්වය දුර්වල නිසා. ඒ අනුව උප සභාපතිතුමා ඇතුළු සියලුම දෙනා එදිනට පැමිණ සහයෝගය දක්වන්න. තමන්ගේ බල ප්‍රදේශයේ තියෙන ප්‍රාදේශීය සභා පෙර පාසල් මේ උත්සවයට සහභාගි කරවන්න. විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාවෙන් පරිබාහිරව තියෙන පෙර පාසල් වල ගුරුතුමියන්ලා මාත් එක්ක යම් නොහොඳකුත් වුණා. හේතුව ඒ පෙර පාසල්වල ළමයින්ට මේ අවස්ථාව ලබා නොදෙන්නෙ මොකද කියලා. ඒ අවස්ථාවේදී මම කිව්වේ, මගේ පෞද්ගලික කැමැත්ත තිබුනට, බල ප්‍රදේශයේ සියලුම පෙර පාසල් සම්බන්ධ කරගෙන මේ උත්සවය කරන්න තරම් අපේ ආර්ථික තත්ත්වය යහපත් නැහැ කියලා. ඒ නිසා ප්‍රාදේශීය සභා පෙර පාසල් 15වේ ළමයින් පමණයි මේ අවස්ථාවට ඇතුලත් කරගන්න පුළුවන් වුනේ කියලා. නමුත් අපි බලාපොරොත්තු වෙනවා මාපලගම අවට තියෙන පෞද්ගලික පෙර පාසල් ළමයින්වත් මේ සඳහා සම්බන්ධ කරගන්න. තෑගිබෝග ලබා දීමේදී නම් අපි අපහසුතාවයට පත්වේවි. ගරු මන්ත්‍රීතුමාලා, ඔබතුමන්ලා කවුරුහරි ඉන්නවනම්, අපට අනුග්‍රහය, දායකත්වය ලබාදෙන්න, දරුවන්ට මොනවහරි තෑග්ගක් ලබා දෙන්න, අන්න ඒ අවස්ථාව ඔබතුමන්ලාට තියෙනවා. අපේ ළමයි 400 ක් විතර ඉන්නවා. මම හිතන්නෙ, පිට ළමයිත් 400 ක් විතර ඉන්නවා. අපි තෑග්ගක් දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම නැවතත් සියලුම දෙනාට ආරාධනා කරනවා මේ සඳහා සහභාගි වෙන්න කියලා. අපි පරිත්‍යාගශීලීන්ට පෞද්ගලික මට්ටමෙන් දැනුම් දුන්නා. එතුමන්ලා පොරොන්දු වුණා යම් යම් පරිත්‍යාග කරන්න. කොහොම නමුත් දරුවන්ගේ යහපත තකා, දරුවන්ට විනෝදාස්වාදය ලබා ගන්නට, ඒ වගේම  මේවට සහභාගි වෙලා මේවායේ අඩුපාඩුවක් තියෙනවා නම් මට පෙන්වා දෙන්න. මොකද සභාපති හැටියට මම විතරක් මේක කරනවා නෙවෙයි. ඔබ සියලු දෙනාගේම සහභාගීත්වය අවශ්‍යයි. මොකද පසුගිය දා පන්සලේ තිබුන උත්සවයටත්, ආරාධනා කලාට මන්ත්‍රීවරුන්ට සහභාගි වෙන්න බැරි වුණා.

ඒවගේම ගරු මන්ත්‍රීවරුනි, ඉදිකරන්න බලාපොරොත්තුවන ආදාහනාගාරය සඳහා එම ඉඩම ඇල්පිටිය වතු සමාගම මගින් මුදල් අය කිරීමකින් තොරව සභාව වෙත ලබාදීමට කැමැත්ත පළ කරලා තියෙනවා. ඒ ගැන ඇල්පිටිය වතු සමාගමට අපේ ස්තුතිය මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ඒවගේම, වර්තමානය වන විට දේශපාලන උනුසුමක් ඇතිවී තියෙනවා. ඉදිරියෙදි පැවැත්වෙන ජනාධිපතිවරණය නිසා. අපේ ඉදිරි ජනාධිපතිවරණයට අපේක්ෂකයෝ තිස් පස් දෙනෙක් ඉදිරිපත් වෙලා තියෙනවා. මේක විශේෂිත වූ ජනාධිපතිවරණයක්. මොකද හිටපු ජනාධිපතිවරයෙක්, අගමැතිවරයෙක්, නොඉල්ලන අලුත් අපේක්ෂකයන් පමණක් ඉදිරිපත් වන ජනාධිපති මැතිවරණයක් නිසා. ගෝඨාභය රාජපක්ෂ මැතිදුන් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ අපේක්ෂකයා විදිහට ඉල්ලනවා. ඒ වගේම සජිත් ප්‍රේමදාස ඇමතිතුමා එක්සත් ජාතික පෙරමුණෙන් ඉල්ලනවා. අනුර කුමාර දිසානායක මැතිතුමා ජාතික ජනබලවේගයෙන් ඉල්ලනවා. ඒ වගේම තවත් නොයෙක් නොයෙක් සංවිධානවලින් අපේක්ෂකයන් ඉල්ලුම් කරලා තියෙනවා. ඒ වගේම දමිළ අපේක්ෂකයන්, මුස්ලිම් අපේක්ෂකයන් ඉන්නවා. අපේ දේශපාලන මතිමතාන්තර කොහොම වෙතත්, අපි සියලු දෙනා සහයෝගීව කටයුතු කරන්න ඕන. අපේ දේශපාලන මතය අනුව අපේ බලාපොරොත්තුව අනාගත ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිදුන් පත්වෙන්න කියලා. වර්තමානයේ ඔබතුමන්ලා අනිත් දේශපාලන මතිමතාන්තර අනුව බලාපොරොත්තු වෙන්නේ එතුමන්ලා. නමුත් ඉදිරි ජනාධිපතිවරණයට අපි කවුරුත් සහයෝගයෙන්, සුහදව කටයුතු කරන්න ඕන. මොකද කවුරුත් එන්නෙ රටට සේවය කරන්න, රටේ බලාපොරොත්තු ඉටු කරන්න, සාමකාමී රටක්, ඒකීය රටක්, විශ්වාසයෙන් යුතුව ජීවත් විය හැකි රටක්, ආරක්ෂිත රටක් හැටියට පවත්වාගෙන යන්න. ඒ නිසා අපි බලාපොරොත්තු වෙන අනාගතය සුභ අනාගතයක් වෙන්න ප්‍රාර්ථනා කරනවා. විශේෂයෙන්ම එළඹෙන ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණය එකොළොස් වැනිදා පැවැත්වෙනවා. ඒකෙනුත් අපි විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබාගන්න බලාපොරොත්තු වෙනවා. නමුත් මතක තියාගන්න, අපි සියලු දෙනා ශ්‍රී ලාංකිකයන් හැටියට, ශ්‍රී ලාංකික සිංහලයන් හැටියට සියලුදෙනා භේදභින්න ඇති නොකරගෙන එකමුතුව කටයුතු කරන්න ඕන. යම් අවස්ථාවලදී කොඩි වැළට, පෝස්ටරයට අපි භේදභින්න වෙන්න පුළුවන්. නමුත් අපේ මන්ත්‍රීවරු කවුරුවත් ඒකට යොමු වෙන්න එපා. නීතියට ගරු කරලා, නීත්‍යානුකූල පුරවැසියන් හැටියට අපි කටයුතු කරමු. උප සභාපතිතුමා ඇතුළු අද පැමිණ සිටින සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාට ස්තූති කරමින්, සියලු දෙනාගේ අනාගත බලාපොරොත්තු ඉටු වේවා කියා ප්‍රාර්ථනා කරමින්, අද සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. සැමට සම්මා සම්බුදු සරණයි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                                   දිනය:- ..............................